Australian Government
Immigration Assessment Authority

# සංක්‍රමණ ඇගයුම් අධිකාරිය (IAA) ගැන ඔබ දැනගත යුතු දේවල්

## IAA විසින් කරන කටයුතු මොනවාද?

සංක්‍රමණ ඇගයුම් අධිකාරිය ස්ථාපිත කරන ලද්දේ 1958 සංක්‍රමණ පනත යටතේය (*Migration Act 1958*)(පනත). අපි සංක්‍රමණ සහ දේශසීමා ආරක්ෂක ඇමතිවරයා (ඇමතිවරයා) විසින් ගනු ලබන සමහර තීරණ ඉක්මනින් සමාලෝචනයට ලක් කිරීමට බලය පැවරී ඇති ස්වාධීන ආයතනයකි. මේ තීරණ වනුයේ ඉක්මන් මාර්ගික ඉල්ලුම්කරුවන් (fast track applicant) ලෙස හඳුන්වන තැනැත්තන්ට ආරක්ෂිත වීසා දීම ප්‍රතික්ෂේප කිරීමට ඇමතිවරයා ගත් තීරණයන්ය. ඔබ 2012 අගෝස්තු 13 වන දින හෝ ඊට පසු, නමුත් 2014 ජනවාරි 1 වන දිනට පෙර, වලංගු වීසා බලපත්‍රයක් නොමැතිව බෝට්ටුවෙන් ඔස්ට්‍රේලියාවට පැමිණියේ නම් සහ ඔබට ඔස්ට්‍රේලියාවේ ආරක්ෂිත වීසා බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කිරීමට ඇමතිවරයා විසින් අවසර ලබා දී ඇත්නම්, ඔබ ඉක්මන් මාර්ගික ඉල්ලුම්කරුවෙකි. ඇමතිවරයා විසින් නියම කරන ලද පුද්ගල සමූහයකට ඔබ අයිතිවන්නේ නම් එවිටද ඔබ ඉක්මන් මාර්ගික ඉල්ලුම්කරුවෙකි.

සමහර ඉක්මන් මාර්ගික ඉල්ලුම්කරුවන්ට IAA සමාලෝචනයක් සඳහා සුදුසුකම නොලැබේ. ඔබට ආරක්ෂිත වීසා බලපත්‍රයක් ලබා දීම ප්‍රතික්ෂේප කර ඇත්නම්, IAA සමාලෝචනයක් සඳහා ඔබට සුදුසුකම තිබේද නැත්ද යන්න ස්වදේශ කටයුතු දෙපාර්තමේන්තුව (දෙපාර්තමේන්තුව) විසින් ඔබට දන්වනු ඇත.

IAA විසින් සමාලෝචන සඳහා ඉල්ලුම්පත්‍ර ඉක්මන් මාර්ගික ඉල්ලුම්කරුවන්ගෙන් කෙලින්ම බාර ගනු නොලැබේ. ඔබ ආරක්ෂිත වීසා බලපත්‍රයක් ලබා දීම ප්‍රතික්ෂේප කර ඇති, සමාලෝචනයක් සඳහා සුදුසුකම සහිත ඉක්මන් මාර්ගික ඉල්ලුම්කරුවෙක් නම්, ඔබේ නඩුව දෙපාර්තමේන්තුව විසින් ඉබේම සමාලෝචනයක් සඳහා ඉදිරිපත් කරනු ඇත.

## IAA විසින් ගත හැක්කේ කෙබඳු තීරණද?

IAA විසින් දෙආකාරයක තීරණ ලබා දීමට පුළුවන. ආරක්ෂිත වීසා බලපත්‍රයක් ලබා දීම ප්‍රතික්ෂේප කිරීමට දෙපාර්තමේන්තුව ගත් තීරණය සමග එකඟ වීමට, හෝ උදාහරණයක් ලෙස අප ඔබව සරණාගතයෙක් ලෙස පිළිගන්නා බැවින්, වැඩිදුර සළකා බැලීම පිණිස නඩුව ආපසු දෙපාර්තමේන්තුව වෙත යැවීමට අපට හැකියාව ඇත. ආරක්ෂිත වීසා ලබාදීමේ බලය IAA සතුව නොමැත.

අප විසින් සළකා බලනු ලබන්නේ දෙපාර්තමේන්තුව විසින් ප්‍රතික්ෂේප කිරීමේ තීරණය ගත් අවස්ථාවේදී දෙපාර්තමේන්තුව ඉදිරියේ තිබුන තොරතුරු පමණි. එනමුත් සුවිශේෂ අවස්ථා වලදී අලුත් තොරතුරු සළකා බැලීමට ඉඩ තිබේ.

ඔබේ නඩුව දෙපාර්තමේන්තුව විසින් IAA වෙත යොමු කර ඇත්නම්, අපේ තීරණය සහ අපේ තීරණයට හේතු අප විසින් ඔබ වෙත කෙලින්ම දැනුම් දෙනු ලැබේ.

ආරක්ෂිත වීසා පිළිබඳ උපමාන ඔස්ට්‍රේලියානු සංක්‍රමණ පනතේ අන්තර්ගතව ඇත. බොහෝ අවස්ථා වලදී, මූලික ප්‍රශ්න වනුයේ ඔබ සරණාගතයෙක්ද, හෝ, විකල්ප වශයෙන්, ඔබව ඔස්ට්‍රේලියාවෙන් වෙනත් රටකට පිටමං කලහොත් ඔබට සැලකිය යුතු පීඩා ඇතිවීමේ සැබෑ අවදානමක් තිබේද යන්නයි.

ඔබේ වීසා ඉල්ලුම් පත්‍රයෙහි පවුලේ අනිකුත් සාමාජිකයන්ද අඩංගු නම්, ඔබ සියලු දෙනාගේම නඩු එක්ව සළකා බැලීමට අපි උත්සාහ ගන්නෙමු.

## සමාලෝචනයට කොපමණ කල් ගතවේද?

සෑම නඩුවක්ම එකිනෙකට වෙනස් බැවින් මීට කොපමණ කල් ගතවේද යන්න කීමට අපහසුය. බොහොමයක් සමාලෝචන සති හයක් ඇතුලත සම්පූර්ණ කිරීම IAA ඉලක්කයයි; එහෙත් සමාලෝචනයක් සඳහා ගතවන කාලය නොයෙක් සාධක මත රඳා පවතී.

**මගේ නඩුව පිළිබඳව කිනම් තොරතුරු IAA සතුව තිබේද?**

ඔබේ නඩුවට අදාල යයි දෙපාර්තමේන්තුව විසින් සළකනු ලබන සියලුම ලියකියවිලි දෙපාර්තමේන්තුව විසින් IAA වෙත ලබා දෙනු ඇත. ඔබේ ආරක්ෂිත වීසා ඉල්ලුම් පත්‍රය හා සම්බන්ධව ඔබ දෙපාර්තමේන්තුවට සපයන ලද ඕනෑම ලියවිල්ලක් මීට අයත්වේ. ඔබට ආරක්ෂිත වීසා බලපත්‍රයක් ලබා දීම දෙපාර්තමේන්තුව විසින් ප්‍රතික්ෂේප කිරීමට පෙර දෙපාර්තමේන්තුව වෙත ඔබ විසින් බාර දුන් ඕනෑම ලියවිල්ලක් මිට අයිති වේ. සාමාන්‍යයෙන් අපි දෙපාර්තමේන්තුවේ තීරණයක් සමාලෝචනය කරන්නේ දෙපාර්තමේන්තුව විසින් අපට සපයන ලද තොරතුරු මත පමණක් පිහිටා ගෙනය.

**IAA වෙත අලුත් තොරතුරු ඉදිරිපත් කිරීමට මට පුලුවන්ද?**

අපට අලුත් තොරතුරු සළකා බැලීමට හැකි වන්නේ එම අලුත් තොරතුරු සළකා බැලීම යුක්තිමත් බව පෙන්වන විශේෂිත හේතු ඇත්නම් පමණි. අලුත් තොරතුරු වනුයේ කාරණයට අදාල සහ තම තීරණය ගන්නා අවස්ථාවේදී දෙපාර්තමේන්තුව අබියස නොතිබුන තොරතුරුය.

අප විසින් අලුත් තොරතුරු සළකා බැලීම ඔබට අවශ්‍ය නම් ඔබ පහත සඳහන් කරුණු පැහැදිලි කර දිය යුතුය:

- ඔබට ආරක්ෂිත වීසා බලපත්‍රයක් ලබා දීම දෙපාර්තමේන්තුව විසින් ප්‍රතික්ෂේප කිරීමට පෙර දෙපාර්තමේන්තුව වෙත මෙම තොරතුරු දීමට ඔබට නොහැකි වුයේ මන්ද, හෝ
- මෙම අලුත් තොරතුරු විශ්වාසනීය පුද්ගලික තොරතුරු වන අතර, එම තොරතුරු දෙපාර්තමේන්තුව විසින් දැනගන සිටියා නම්, එයින් දෙපාර්තමේන්තුවේ තීරණයට බලපෑමක් සිදුවීමට ඉඩ තිබුන බව.

මෙම පැහැදිලි කිරීම පිටු 5 කට වඩා දීර්ඝ නොවිය යුතු අතර, එය ඔබ විසින් අපට සපයන අලුත් තොරතුරු සමග ඉදිරිපත් කල යුතුය.

කරුණාවෙන් සළකන්න:

- අලුත් තොරතුරු ඔබේ නඩුවට අදාල වන්නේ කෙසේද යන්න පැහැදිලි කල යුතුය.
- ඔබ මාධ්‍ය වාර්තා හෝ ඔබේ රට පිළිබඳ වාර්තා ගැන සඳහන් කරන්නේ නම් එම වාර්තා වල මුලාශ්‍ර ඔබ විසින් හඳුන්වා දිය යුතුය.
- අදාල වාර්තාවේ පිටපතක් හෝ එයින් උපුටාගත් අදාල සාරයද ඔබ විසින් අපට ලබා දිය යුතුය. පොදුවේ ලබාගතහැකි වාර්තා වල ලැයිස්තු හෝ පොදුවේ ලබාගතහැකි වාර්තා වල අඩි සන්ධාන අප බාර නොගන්නෙමු.
- ඔබ අප වෙත එවන ඉංග්‍රීසි නොවන ලියවිලි සමග NAATI පිළිගත් පරිවර්තකයකු විසින් කරන ලද එම ලියවිලි වල ඉංග්‍රීසි පරිවර්තනයක්ද අප වෙත එවිය යුතුය. පරිවර්තනයක් අපට ලබා නොදුන්නොත් එම ලියවිල්ල සළකා බැලීමට අපට නොහැකි වීමට පුළුවන.

අප විසින් ඔබෙන් ඉල්ලා නැති අලුත් තොරතුරු, ඔබේ නඩුව දෙපාර්තමේන්තුව විසින් අප වෙත යොමු කර දින 21ක් ඇතුලත අපට ලබා දිය යුතුය.

ඉතා සීමිත අවස්ථාවන්හිදී, ඔබේ නඩුව ගැන අලුත් තොරතුරු හෝ අදහස් ලිඛිතව හෝ සම්මුඛ සාකච්ජාවකදී අපට සපයන ලෙස ඔබෙන් ඉල්ලා සිටීමට ඉඩ ඇත.

### IAA වෙත සැළකර සිටීමක් ඉදිරිපත් කිරීමට මට පුලුවන්ද?

පහත සඳහන් දේ ගැන ලිඛිත සැළකර සිටීමක් ඉදිරිපත් කිරීමට ඔබට හැකිය:

- දෙපාර්තමේන්තුවේ තීරණයට ඔබ එකඟ නොවන හේතු, සහ
- ඔබ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කල යම් ඉල්ලීමක් හෝ කාරණයක් ඔවුන් සළකා බලා නැතිනම්.

ඔබේ සැළකර සිටීම සංක්ෂිප්ත විය යුතුය.  ඔබේ සැළකර සිටීම පිටු 5 කට වඩා දීර්ඝ නොවිය යුතු අතර, ඔබේ නඩුව දෙපාර්තමේන්තුව විසින් අප වෙත යොමු කර දින 21ක් ඇතුලත අපට ලබා දිය යුතුය.

### IAA සතු තොරතුරු මට ලබා ගැනීමට පුළුවන්ද?

1982 තොරතුරු නිදහස පිලිබඳ පනත (*Freedom of Information Act 1982)* යටතේ, සමහර සීමාවන්ට යටත්ව, ඔබේ නඩුව සම්බන්ධව IAA සතු ඕනෑම ලියවිල්ලක් ලබාදෙන ලෙස ඔබට ඉල්ලුම් කිරීමට පුළුවන. යම් තොරතුරු එළිදරව් කිරීමට අපට නොහැකි නම්, එළිදරව් නොකිරීමට හේතු අපි ඔබට දන්වන්නෙමු. යම් ලියවිල්ලක් ඔබට එළිදරව් නොකිරීමට අප ගත් තීරණය නැවත සළකා බලන ලෙස ඔබට ඉල්ලුම් කල හැක්කේ කෙසේද යන්න ගැනද අපි ඔබට දන්වන්නෙමු. ලියවිලි ලබා ගැනීම ගැන වැඩි විස්තර අපගේ www.iaa.gov.au වෙබ් අඩවියේ අඩංගුවේ.

### IAA මා සමග සන්නිවේදනය කරන්නේ කෙසේද?

සාමාන්‍යයෙන් IAA ඔබ සමග සන්නිවේදනය කරන්නේ ඊ මේල් මගිනි. අපි ඔබව දුරකථනයෙන් ඇමතීමටද ඉඩ තිබේ.

ලිපි ගනුදෙනු ඔබ වෙත එවීමට හෝ ඔබ විසින් පත්කරන තැනැත්තෙකුට ඔබ වෙනුවෙන් ලිපි ලබා ගැනීමට වුවද පුළුවන (මෙම තැනැත්තා ඔබේ බලයලත් ලබන්නා ලෙස හැඳින්වේ). ඔබ බලයලත් ලබන්නෙක් පත් කලහොත් සියලුම ලිපි අප විසින් එම තැනැත්තා වෙත යොමු කරනු ලැබේ.

දෙපාර්තුමේන්තුවෙන් ලිපි ලබා ගැනීමට ඔබ වෙනත් අයෙකු මීට පෙර පත් කර ඇත්නම්, එම පත් කිරීම IAA සමාලෝචනයට අදාල නොවේ. අප විසින් එවන ලිපි ඔබ වෙනුවෙන් ලබා ගැනීමට වෙනම කෙනෙක් පත් කිරීමට ඔබට අවශ්‍ය නම්, ඔබ එම අයගේ නම සහ ඇමතුම් විස්තර අප වෙත දැන්විය යුතුය.

ඔබේ ඇමතුම් විස්තර වල යම් වෙනසක් සිදු වූ විට සහ ඔබට බලයලත් ලබන්නෙකු සිටී නම් ඒ අයගේ ඇමතුම් විස්තර වල යම් වෙනසක් සිදු වූ විට , ඔබ ඒ බව අපට අප්‍රමාදව දැන්විය යුතුය. යම් වෙනසක් සිදු වූ විට ඒ බව ඔබේ බලයලත් ලබන්නාටත් (ඔබට එම අයෙක් සිටී නම්) සහ දෙපාර්තමේන්තුවටද ඒ බව ඔබ විසින් දැන්විය යුතුය.

iaa@iaa.gov.au ඔස්සේ ඊමේල් මගින් හෝ 1800 205 919 අංකය ඔස්සේ දුරකථනයෙන් ඔබට අපව ඇමතීමට හැකිය.

### උපදෙස්, උපකාර සහ නියෝජනය

අවසන් තීරණය, ඔබට වෘත්තීය උපදෙස් හෝ උපකාර ලැබුනේද යන්න මත රඳා නොපවතින අන්දමට IAA ක්‍රියා පිළිවෙල සැලසුම් කර ඇත්තේ සරල ලෙසටය. එනමුත් ඔබට පුළුල් පරාසයක ආයතන සහ පුද්ගලයන්ගෙන් උපදෙස් සහ උපකාර ලබා ගැනීමට ඔබට පුලුවන්කම ඇත. අප විසින් කිසිම සේවා සපයන්නෙක් නිර්දේශ කරන්නේ හෝ

අනුමත කරන්නේ නැත. යම් අයෙකු තෝරා ගන්නා විට ඔබ පරෙස්සම් විය යුතු මෙන්ම ඔවුන් ලියාපදිංචි සංක්‍රමණ නියෝජිතයෙක්ද, ඕස්ට්‍රේලියානු නීතිඥයෙක්ද එසේ නැතහොත් ඔබට නීති උපදෙස් දීමට හැකියාව ඇති අයෙක්ද යන්න අසා තහවුරු කර ගත යුතුය.

සංක්‍රමණ නියෝජිතයෙක් සොයා ගැනීම සහ භාවිතා කිරීම ගැන විවිධ භාෂා වලින් ලිඛිත තොරතුරු සංක්‍රමණ නියෝජිතයන් ලියාපදිංචි කිරීමේ අධිකාරියේ (Office of the Migration Agents Registration Authority) වෙබ් අඩවියේ අඩංගු වේ (www.mara.gov.au). යම් සංක්‍රමණ නියෝජිතයෙක් ලියාපදිංචි නියෝජිතයෙක්ද නැත්ද යන්න මෙම වෙබ් අඩවියෙන් පරීක්ෂා කර බැලීමට පුළුවන.

ඕස්ට්‍රේලියානු නීතිඥයෙක් සොයා ගැනීම සහ සේවය ලබා ගැනීම පිළිබඳ තොරතුරු අපගේ වෙබ් අඩවියේ අඩංගු අදාල ප්‍රාන්ත හෝ බල ප්‍රදේශ වල නීති වෘත්තිය නියාමනය කරන බලධාරීන්ගේ ලැයිස්තුවෙන් ඔබට ලබා ගත හැකිය (www.iaa.gov.au).

ඔබ IAA සමග කටයුතු කරන විට වෙනත් කෙනෙකු විසින් ඔබව නියෝජනය කිරීමට පුළුවන. ඔබ වෙනුවෙන් අපව අමතා ඔබේ නඩුව හා සම්බන්ධව අප සතු ලියවිලි ඉල්ලා සිටීමට නියෝජිතයෙකුට පුළුවන. සාමාන්‍යයෙන් එකම පුද්ගලයෙක්ව නියෝජිතයා සහ බලයලත් ලබන්නා යන කාර්යයන් දෙකටම පත් කරනු ලැබේ.

**මට යම් පැමිණිල්ලක් තිබේනම් කල යුත්තේ කුමක්ද?**

IAA විසින් සපයන සේවයේ ප්‍රමිතිය ගැන ඔබට යම් අදහසක් හෝ පැමිණිල්ලක් තිබේනම්, පැමිණිල්ලක් ඉදිරිපත් කරන අන්දම ගැන උපදෙස් සඳහා කරුණාකර අපේ වෙබ් අඩවිය බලන්න (www.iaa.gov.au).